චක්‍රලේඛ අංක : 08/2017

සමුපකාර සේවක කොමිෂන් සභාව (බ:ප:),
අංක 109 , හතර වන මහල,
මහ වීදිය,
බත්තරමුල්ල.
2017.05.04

බස්නාහිර පළාතේ සියළුම විවිධ සේවා සමුපකාර සමිති,
දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්, සණස සමිති, දිස්ත්‍රික් සමුපකාර මණ්ඩල සහ
අනෙකුත් සියලුම ලියාපදිංචි සමුපකාර සමිති සභාපතිවරුන් වෙත,

**<u>සහකාර සණස බැංකු කළමනාකරු III ශ්‍රේණිය - වැ:ප: 104:8</u>**

**සියලුම සණස** සමිති සඳහා සහකාර සණස බැංකු කළමනාකරු III ශ්‍රේණිය තනතුර ඇති කිරීමට කටයුතු කර ඇති අතර ඒ සඳහා පහත සඳහන් සුදුසුකම් අනුමත කරන බව කොමිෂන් සභාවේ නියමය පරිදි දන්වමි.

1) තනතුරේ නම : සහකාර සණස බැංකු කළමනාකරු III
වැටුප් පරිමාණ අංකය : 104:8
අවම වයස් සීමාව : අවුරුදු 21
උපරිම වයස් සීමාව : අවුරුදු 45

**<u>තනතුර සඳහා අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්</u> :**

(අ) 104:09 වැටුප් පරිමාණයේ ස්ථිර තනතුරක වසර 03ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම හෝ 105:10 වැටුප් පරිමාණයේ ස්ථිර තනතුරක වසර 06ක සතුටුදායක සේවා කාලයක් තිබීම

**හෝ**

**(ආ)** ගණිතය, සිංහල භාෂාව යන විෂයන් ඇතුළුව විෂයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව අ:පො:ස (සා:පෙ:) විභාගය විෂයන් හයකින් සමත්වීම හෝ සමුපකාර සාමාන්‍ය පෙළ සමත්වීම හෝ **සහ** පිළිගත් ආයතනයක අදාල ක්ෂේත්‍රයේ වසර 03ක සතුටුදායක සේවා පළපුරුද්දක් ලබාතිබීම

**හෝ**

**(ඇ)** අ:පො:ස: (උ.පෙ.) වාණිජ අංශයෙන් සමත් විම සහ පිළිගත් ආයතනයක අදාල ක්ෂේත්‍රයේ වසර 02ක සේවා පළපුරුද්දක් ලබාතිබීම

02. සියළුම සණස සමිති විසින් මෙම තනතුර ඇතුළත් වන පරිදි පිරිස් බල තක්සේරුව සංශෝධනය කරගැනීමට කටයුතු කළයුතු අතර පිරිස් බල තක්සේරුවට මෙම තනතුර ඇතුළත් කරගැනීමෙන් පසුව දැනට සණස සමිතිවල **පමණක්** වැ:ප:104:8 කළමනාකරු (විශේෂ ශ්‍රේණිය) තනතුරේ කොමිෂන් සභා ස්ථිර සේවකයින් මෙම නව තනතුරට අන්තර්ග්‍රහණය කිරීම සඳහා පහත සඳහන් ලිපිලේඛන කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වන බව ද වැඩිදුරටත් දන්වමි.

- ඇමුණුම 01
- කොමිෂන් සභා අනුමත පත්වීම් ලිපිය
- කාරක සභා තීරණය
- නිලධාරියාගේ එකඟතාවය

එස්.ඒ.එල්.රංගනී,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

**පිටපත් :**

I. ප්‍රධාන ලේකම්, බස්නාහිර පළාත.
II. ලේකම්, සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය, බස්නාහිර පළාත.
III. සමුපකාර සංවර්ධන කොමසාරිස්/සමිති රෙජිස්ට්‍රාර්, බස්නාහිර පළාත.
IV. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (කොළඹ/ ගම්පහ/ කළුතර)
V. අධ්‍යක්ෂ, බස්නාහිර පළාත් සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය.
VI. ලේකම්, මධ්‍යම රජයේ සමුපකාර සේවක කොමිෂන් සභාව.
VII. සියළුම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන්.
VIII. සියළුම වෘත්තීය සමිති සංගම්